339

RARE

# ආදි බුදුදහමෙහි සහ කාර්ටීසියානු දර්ශනයෙහි පිළිබිඹු වන බුද්ධිවාදී ලක්‍ෂණ පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධය

2004 පෙබරවාරි



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 339 |
| වර්ග අංකය | |




නාඹටුන්නේ විමලඤාණ හිමි
(B.A,M.A, Dip.in .Ed)
ශිෂ්‍ය අංකය FGS/P/2001/487/R

1 - JUL 2006

## සාරාංශය

දර්ශනය වශයෙන් හඳුන්වනු ලබන විෂය පද්ධති රැසක් ඈත ඉතිහාසයේ සිට ලෝකය තුළ භාවිත වේ. ඒවා භාරතීය හා බටහිර දර්ශන වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැකිය. මෙම දාර්ශනික ක්ෂේත්‍ර දෙකේ ප්‍රධාන පරමාර්ථය දැනීම සහ බුද්ධිය ගවේෂණය කිරීම පිණිස න්‍යායාත්මකවූත් ප්‍රායෝගිකවූත් ක්‍රමවේද හඳුන්වා දීමයි. ඥාන ගවේෂණයෙහි භාවිත පදනම අනුභූතිවාදය සහ බුද්ධිවාදය යටතේ සංග්‍රහ වේ. ප්‍රාගානුභූත සහජ සංකල්ප මාර්ගකොට ගෙන ඒවායින් වෙනත් සත්‍යයන් ගම්‍ය කිරීම බුද්ධිවාදයයි.

කර්ම මාර්ගය ප්‍රමුඛ කරගත් වෛදික බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළ ද පාරභෞතික ආගමික සංකල්ප තහවුරු කිරීම සඳහා බුද්ධිවාදී ක්‍රම ශිල්ප උපයෝගී කරගෙන ඇත. ආරණ්‍යක–උපනිශද් චින්තනද්වය ද භක්තිවාදී කර්ම මාර්ගය බැහැර කරමින් බුද්ධිවාදී ඥානමාර්ගය සත්‍ය ගවේෂණය පිණිස යොදාගෙන ඇත. භාරතීය ආගමික, දාර්ශනික චින්තාව භක්තිවාදී අනුභූතිවාදී සහ බුද්ධිවාදී ක්‍රම උපයෝගී කරගැනීමෙන් ලද අග්‍රඵලය ලෙස සැළකිය හැක්කේ බෞද්ධ චින්තනයේ උදාවයි.

තේල්ස් නම් මෙලේසියානු චින්තකයාගෙන් බටහිර දර්ශනය ඇරඹෙයි. එතැන් පටන් ආදානග්‍රාහී මධ්‍යතන අවධිය තෙක් බටහිර දර්ශනය බුද්ධිවාදී ක්‍රමවේදයෙන් ද පෝෂණය ලැබීය. මධ්‍යතන යුගයේදී කතෝලික දේවධර්මය පිළිබඳ විශ්වාසය සහ භක්තිය තහවුරු කිරීම සඳහා ග්‍රීක දර්ශනයේ මූලධර්ම උපයෝගී කරගෙන ඇත. වසර දහසකට ආසන්න කාලයක් ක්‍රියාත්මකවූ අඳුරු යුගය නිමා කරමින් බටහිර දාර්ශනික ඉගැන්වීම් දේව ධර්මයෙන් බැහැර කොට නියත දාර්ශනික පදනමක් හඳුන්වා දෙන්නේ බටහිර බුද්ධිවාදයේ ආරම්භකයා වශයෙන් සළකන රෙනේ ඩේකාට් විසිනි. එම අදහස් විචාරයට ලක්කරමින් පෝෂණය කරනු ලබන්නේ ස්පිනෝසා සහ ලෛබ්නිස් යන බුද්ධිවාදීන් දෙදෙනා විසිනි. බුද්ධිවාදය විවේචනය

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

කරමින් අනුභූතිවාදී ඉගැන්වීම් ඉදිරිපත් වන අතර ඉමැනුවෙල් කාන්ට් විසින් මධ්‍යම ප්‍රතිපදාවක් අනුගමනය කරමින් නවතම ඥාන විභාගයක් දර්ශනයට එකතු කළේය.

බෞද්ධ ඥාන ගවේෂණයෙහි මුඛ්‍ය පරමාර්ථය යථාර්තාවබෝධයයි. ඒ සඳහා ව්‍යවහාර මෙන්ම පරමාර්ථ ඥානය ද වැදගත් වේ. ඉන්ද්‍රිය මෙන්ම අතීන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය ද පිළිගැනේ. බුද්ධිවාදී ලක්‍ෂණ මෙන්ම අනුභූතිවාදී ලක්‍ෂණ ද ආදි බුදුදහමෙහි නිරූපිතය. යථාර්තාවබෝධය පිණිස දැනීම, බුද්ධිය මෙන්ම ප්‍රඥාවේ වර්ධනය ද අවශ්‍ය වේ. එහිදී බුදු දහම තුළ තර්කානුකූල බුද්ධිවාදී ක්‍රම ශිල්ප ලෝක ව්‍යවහාරය පැහැදිලි කිරීම පිණිස උපකරණාර්ථයෙන් යෙදෙයි. එය අන්තගාමී, දෘෂ්ටිගතික පිළිවෙතක් වශයෙන් නොවේ. එබැවින් බුද්ධිවාදී ලක්‍ෂණ ආදි බුදුදහමේ පිළිබිඹු වන්නේයැයි පිළිගැනීමට සිදුවේ. එහෙත් විමුක්තිය තර්කයට හෝ බුද්ධියට විෂය නොවේ.

නවතම විද්‍යාවේත් උසස් ගණිතයේත්, නිදහස් හෘදය සාක්‍ෂියේත් සංකලනයෙන් පැණනැගී ඩේකාට්ගේ දර්ශනයේ ආරම්භය සංශයයි. ඔහු සියල්ල සැක කරනු ලැබ ඇත්තේ සැකය සඳහාම නොව සැක කළ නොහැකි විශ්වසනීය ශක්තිමත් නිසැක පදනමක් සඳහාය. මෙය කාර්ටීසියානු සංශයයි. "මම සිතමි. එබැවින් මම පවතිමි"යි යන්න ඒ අනුව එළඹෙන පළමු නියතතාවයි. ඒ අනුසාරයෙන් දෙවියන් සහ ලෝකයේ පැවැත්ම පිළිබඳ නියතතාව ද ගම්‍යකරගනී. මෙහි භාවිත ක්‍රමවේදය කාර්ටීසියානු බුද්ධිවාදයයි.

ආදි බුදු දහමේ ඉගැන්වීම් කාර්ටීසියානු දාර්ශනික පදනම ගොඩනැගී ඇති නිගාමී රීතීන් සමග කරුණු ඉදිරිපත් කිරීමේ ස්වභාවය අතින් එක්තරා සමානතාවයක් පෙන්වයි. එහෙත් මෙම චින්තනද්වයෙහි එකිනෙකට හාත්පසින්ම වෙනස්වූ අරමුණු සඳහා එම රීතීන් යොදාගෙන ඇත. කාර්ටීසියානු දර්ශනයේ පදනම වන සංශය භාවිත වන්නේ සත්‍යවූත් නියතවූත් ඒකායන නිගමන ගම්‍යකරගැනීම සඳහාය. එය බෞද්ධ ඉගැන්වීමෙහි සත්‍ය ගවේෂණයෙහි එක් ප්‍රාථමික පියවරක් ලෙස

පමණක් යොදාගැනේ. කෙළෙස් නිවන චර්යාත්මක වැඩ පිළිවෙලක් නිර්දේශිත ආදි බුදු දහමේ බුද්ධිවාදී ලක්‍ෂණ ප්‍රකට වන්නේ එහි ආගමික සන්දර්භයට අනුගතවය. න්‍යායාත්මක සෛද්ධාන්තික ඉගැන්වීමක් වන කාර්ටීසියානු දර්ශනය නියත, ස්ථිරසාර නිගමන ගම්‍ය කර ගැනීමේ ඒකායන මාර්ගය ලෙස බුද්ධිවාදී තර්කනය යොදාගෙන ඇත.